# අවසන් හමුවීම



ඉසුරු හල්කෝවල

# අවසන් හමුවීම

කතෘ ඉසුරු හල්කේවල

ප්‍රථම මුද්‍රණය
අවසන් හමුවීම

කතෘ ඉසුරු හල්කේවල

කෘතිය පළකරන දිනය 2023.11.15
ISBN 978-624-206-676-9

# පිදුම

කුලුදුල් නිර්මාණයක් වූ අවසන් හමුවීම එදිනෙදා ජීවිතයේදී විවිධ මිනිසුන්ට මුහුණ දීමට සිදුවෙන, මුණගැසෙන මිනිසුන් ඇතුළු විවිධ කරුණු අලලා ලියැවුණු කෙටිකතාවකි. මෙම පොත රචනා කිරීම සඳහා මා ධෛර්යමත් කළ මගේ ආදරණීය මව, පියා මෙන්ම මාගේ සහෝදරියටද මේ මොහොතේදී තුති පුදමි.

මා මෙම ග්‍රන්ථය රචනා කිරීමට අදහස් කළේ සතියක පමණ කාලයක් ඉතිරිව තිබියදීය. ඒ අවස්ථාවේදී මහාමායා විදුහලේ සෙනෙවිරත්න මහලේකම් ගුරුපියාණන් ඒ සඳහා දුන් අවස්ථාව ඉතා අගය කොට සලකමි.

මාගේ සියලු සුභ කටයුතු දෙස නෙත් යොමුකරමින් සිටින මාගේ ආදරණීය අත්තම්මා, අත්තා යන අයටද තුති පුදමි.

නන් අයුරින් උදවු උපකාර කළ සැමට මාගේ ප්‍රණාමය !

එච්.එම්.එස් . ඉසුරු බණ්ඩාර හල්කේවල

378 ඩී, බිබිල හංදිය, නාඋල.

මාතලේ.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුමකර ගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිපලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අපහා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය  මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ  දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ  පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර


2023.11.01

# පටුන


| | | |
|---|---|---|
| 01 | ගමට විදුලිය | 1-3 |
| 02 | අවසන් හමුවීම | 4-9 |
| 03 | Online ක්ලාස් | 10-14 |

# ගමට විදුලිය

හතර වටින්ම අඳුර ගලාගොස් අප නිවස වටකොට ගෙන ඇත. අවුරුද්දේ තුන්සිය හැටපස් දවසෙම අප ගමට විදුලිය නැත. විදුලිය ලබා දෙන ලෙස ඉල්ලා ඉහළ පුටු වල සිටින බලධාරීන්ට කොතෙක් කිව්වත් ඔවුන්ගේ පොරොන්දු සියල්ල ඡන්දය අවසන් වන තෙක් පමණි. විභාගයට ඇත්තේ හරියටම තව දින පහකි. කණා මැදිරි එළියක් තරම්වත් ආලෝකයක් නැති පහන් එළිය එයට පලි නැත.

අයියේ තව ඉටි පන්දමක් ඕනැද ?

කොහෙන්ද නංගීට ඉටිපන්දම්. මම පෙරේදා ගෙන්නපු ඉටි පන්දම් පහෙන් තව එකයි ඉතුරු. අනික ඉටිපන්දමක් රුපියල් දෙකක් විතර වෙනවා දැන්...

නෑ ඊයේ අම්මා මන් පාඩම් කරද්දී දුන්නු ඉටි පන්දම මන් අරන් තියා ගත්තා. ඒ ඉටි පන්දම තමා ඔය..

එතකොට නංගී ඊයේ පාඩම් කරේ කොහොමද?

ගෙදර සාලේ කබඩ් එකේ තිබ්බ පරණ ඉටි පන්දම් කැල්ලකින් මන් ඊයේ පාඩම් කරේ

නංගී ගැන එවෙලේ මගේ හිත උණුවෙන තරම් අනුකම්පාවක් ඇති වුනි. ඇය අම්මා විසින් ඇයට ලබා දුන් ඉටි පන්දමද ඉතුරු කර තබාගෙන ඇත මට ඇය ගැන මෙන්ම අපේ ගමම ගැන විශාල දුකක් ඇති උනි..

අයියේ අපේ ගමට ලයිට් එන්නේ නැද්ද?

ඇයගේ කටහඬින් මා කල්පනා ලෝකයෙන් මිදුනි.. එයි නංගී මගේ පිළිතුර ඉතා කෙටි විය.

ඒත් කවද්ද එන්නේ?

ඒක හරියටම කියන්න බෑ නංගී...

අපේ ගමට විදුලිය ලබා ගැනීම ඉතා අපහසු වැඩක් බවත් එය ලගදීම නොවන වැඩක් බවත් දැන් මා හොඳින් දනිමි. ඒ නිසා ඒ කතාවෙන් ගැලවීමේ බලාපොරොත්තුවෙන් මා කුස්සිය දෙසට ගියෙමි..

අම්මේ.. අම්මේ..

කුස්සිය දෙසින් පුංචි අලෝකයක් විහිදේ.. නොසොල්මන් රැයක් නිසා හිරමනය කැරකෙන හඩ හොඳින් ඇසේ. මා අම්මා සමග කතා කිරීමට සිතා එදෙසට ගියෙමි..

ආ පුතේ.. පාඩම් කරලා ඉවරද ?

මොන ඉවරයක්ද අම්මේ තාම එහෙම්ම. විද්‍යාව නම් පාඩම් කරලා ඉවරයි. අනිත් එවා තාම එහෙම්ම.

ඇයි පුතේ ඒවා පාඩම් කරන්නේ නැද්ද?

කොහේ පාඩම් කරන්නද අම්මේ.. ඊයේ ගෙනාපු ඉටිපන්දම් ටිකෙන් තව එකයි ඉතුරු. ඒකත් නංගිගේ එකක්.

ආ.. මන් ඒකීට ඊයේ දුන්න ඉටිපන්දම පුතාට අරන් තියලාද කොහෙද..

පව් අම්මේ නංගීත්..

ඔව් පුතේ තේරුම් කමකටත් නෙවෙයි ඔය පුතාට පාඩම් කරන්න ඕනි නිසා..

ඇත්තටම අපේ ගමට ලයිට් එන්නේ නැද්ද අම්මේ.. මාද බැරිම තැන අම්මාගෙන් ඒ ගැන ඇසුවෙමි.

අම්මා දිග හුස්මක් හෙලුවාය.

ඒ ගැන කතා කරලා වැඩක් නෑ පුතේ.. අප්පච්චී ලේකම් මහත්තයා ගොඩක් කට්ටිය සභාවට ගිහන් ඔය ගැන කතා කරා. ඒ කට්ටියත් ලබන මාසේ වෙද්දි දෙනවා කිය කිය වැඩේ පහු කරනවා..


එතකොට අම්මේ වෙන විදිහක් නැද්ද ?

අනේ මන්දා පුතේ.. තියන් හැම විදියකටම මේ ගමේ මිනිස්සු උත්සහ කරලා බැලුවා..

මේ ගැන තවත් කතා කිරීම වැඩක් නොවන බව තේරුම් ගත් මම පෙරළා කාමරයට ගියෙමි. වැඩක් කල නොහැකි නිසාත් රෑ කෑම නොගෙනම මා ඇඳට වැටුනි. අපේ ගමට ලයිට් ගන්නවා කියන එක බොරු වැඩක් එක්කෝ මන් ලොකු වෙලා හොඳට ඉගෙන ගෙන කොහොම හරි අපේ ගමට ලයිට් අරන් දෙනවා.. කල්පනා ලොකයේ ගිලී සිටීනා විට මා නොදැනුවත්වම නින්ද ගොසිනි..

පුතේ.. පුතේ..

අම්මාගේ කට හඬින් නැවත මා අවදි විය.. කුරුලුගම් වැව ගම්මානයට විදුලිය ලැබෙනවා යනු අප ජීවත්ව ඉන්නා කල හිනයක් පමනක් යැයි සිතා ගත් මා,  මේ එනවා අම්මේ කියා කුස්සිය දෙසට ගියෙමි..



# අවසන් හමුවීම

එක් උදෑසනක නාඋල දුටුගැමුණු වීදියේ ප්‍රධාන බස් නැවතුම් පොලේ මාතලේට බසයක් බලාපොරොත්තුවෙන් විනාඩි දහයක් පමණ මම බලා සිටියෙමි. දුර තියා මා දුටු බස් රිය අනුරාධපුර සිට මහනුවර බලා යන දුර ගමන් සේවා බස් රියක් විය. බස් නැවතුම්පොලෙහි නැවතූ එයට ඉක්මනින් මා නැග ගතිමි. ආසනයක් බලාපොරොත්තුවෙන් වට පිට බැලූ මා හට පිටුපස ගැහැනු ළමයෙක් අසල ආසනයක් නෙත ගැටුණි. එදෙසට ගිය මා එම අසුනේ හිඳ ගතිමි. එතෙක් ජනේලයෙන් පිටත බලා සිටි ගැහැණු ළමයා මා දෙස බැලුවාය.. එක් වරම දෙදෙනාම මොහොතක්ට ගල් ගැසුනි..

කතාව මාගේ පාසල් කාලය දක්වා දිව යයි. මා 11 වසරේ සිට උසස් පෙළ විභාගය කරනා කාළය තුල ඇය මාගේ පෙම්වතියයි. ඇය නමින් අභින්සා නම් සුදු පැහැ තරමක් උස දිගු වරලසකට හිමිකම් කියන රූමත් ගැහැණු ළමයෙකි. පාසල් කාළයේ මා හට ඇය මුණ ගැසුනේ පාසල් නිම වී අප ගෙදර යන බස් රියෙනි. අහම්බෙන් එක් දිනක් මා නෙත ගැටුනු ඇය මා සිත ගැනීමට සමත් වූවාය..

එදා කට කොනින් සිනාවක් පෑ ඇය පසුව මා සමග කතා කළාය. පාසල් යන සෑම දවසකම මටත් ඇයටත් දෙදෙනා නොදැක බැරි විය. අවුරුද්දක පමණ දැන හැඳුනුකම්කට පසුව අප දෙදෙනා පෙම්වතුන් විය.. එදා පටන් ඇය මාගේ පෙම්වතිය විය. මාගේ හැම දෙයකටම ඇය මාත් සමග සිටියාය. කෙසේ හෝ අපේ ආදරය ඉතා ලස්සනට දලු ලා වැඩෙන විට අපගේ ආදරයට එකිනෙක කරදර එන්නට විය. වසර ගණනක් පුරාවට මා සමග සිටි ඇයටත් මටත් අපගේ ආදර කතාවට අපගේ ගෙවල් වලින් විරෝධතා එල්ල වන්නට විය.  මේ හේතු නිසා දෙදෙනාගෙම කඳුලු මතින් ඒ ආදර කතාවට තිත තබන්නට විය.

අපගේ ආදර කතාව අවසන් වීමෙන් පසුත් අප දෙතුන් වරක් නැවත නැවත් හමු වුණි. එවැනි හමුවීමක් සිදු වූ දවස් වලට අනේ තවත් ඉන්න තිබුනා නම් යැයි දෙදෙනාටම සිතුනු වාර අනන්තය..

එක් දිනක් මා හට ඇය විසින් ලියුමක් එවා තිබුනි. එහි වූයේ නැවත අප හමු නොවන බවත් නැවත නැවත අප හමු වීම මටද ඇයටද දුකක් බවත් ඒ නිසා ඇය මා නැවත් හමු නොවන පරිදි දුරකට යන බවත්ය. එසේ සිටීමෙන් මගේ ජීවිතය සතුටින් තියේවිත් කාලයත් සමග මා හට ඇයව අමතක වී යනු ඇති බවත් සතුටින් වැඩ ටික කරන් ඉන්නා ලෙසත් ඇය මට කියා තිබුනි.

ඇය කොහෙට යනවාද කිසිවක් ඇය විසින් එහි සදහන් කොට තිබුනේ නැත. හිතට දැනුනු මහත් වූ දුකත් සමග මා කාලාන්තරයක් තිස්සේ ඇය ගැන සිතමින් කල් ගෙව්වෙමි. ඇයගෙන් ඒ කාලය තුල කිසිදු පණිවිඩයක් හෝ නොමැති විය.

මෙය සිදු වී අද වන විට අවුරුදු 2 ක් පමන ගත වී හමාරය.. නැවත බසයක් තුලදී දෙදෙනාම වසර දෙකකට පසු අහම්බෙන් හමු වී ඇත.. දෙදෙනාම ගොලු වි සිටිය.. තවත් එසේ සිටිය නොහැකි නිසා මා කටහඩ අවදි කලෙමි..

ඉතින්.. අහින්සා ඔයාට කොහොමද?

හොදයි නවීන් ඔයාට කොහොමද? ඇය ඇසුවේ කදුලු පුරවා ගත් දෙනෙතකින් යුතුවය..

මාත් හොදින් ඉන්නවා ඉතින් කියන්න තරම් විශේශයක් නෑ අහින්සා...

ඇය මා දෙස බලා සිටි බැල්මෙන් ඇය මාව අතීතයට ගෙන ගියාය.

ඔයා කොහෙද නොකියම ගියේ.. ආයේ හම්බෙන්න ඕනි නැහැ කියලා?

ඒක දිග කතාවක් නවීන්.. අපි දෙන්නගෙම හොදට මන් ඇත් උනා.. මට කරන්න වෙන දෙයක් තිබ්බෙත් නැහැ.. අපි දෙන්නා ලගින් හිටියා නම් ඒක අපි දෙන්නටම ලොකු දුකක්.. ඒ නිසා මන් ඇත් උනා අපේ ජීවිත වලින්..

ඇයගේ දෙනෙත් කදුලින් තෙත් වී හමාරය..

ඉතින් ඇයි යන තැනක් කිව්වෙ නැත්තේ? ඉන්න තැනකින් පණිවිඩයක් දුන්නේ නැත්තේ?

මන් දන්නවා එහෙම කරා නම් ඔයා ආයේ මාව හොයන් එනවා කියලා.. එතකොට මන් මේ කරපු වැඩෙන් තේරුමක් නැති වෙනවා.. ආයේ මන් ඔයාට දුකක් දෙන එක විතරයි වෙන්නේ..

අනේ මන්දා.. දැන් ඔයාගේ ජීවිතේ කවුරු හරි ඉන්නවද? මා ඇසුවේ පිලිතුර කුමක්දැයි දැන ගන්නා කුතුහලයෙනි.

ඔව් නවීන් කෙනෙක් ඉන්නවා එයා මෙහෙ කෙනෙක් නෙවෙයි.. ඇය එය පැවසුවේ බිම බලන්ය.. ඒ ප්‍රශ්නෙට ඇයට මගේ මුහුන බලා උත්තරයක් දීමට නොහැක...

එය ඇසුනු පසු මගේ නෙතින් කඳුලක් වැටීමට ගියත් බොහොම අමාරුවෙන් මා එය මැඩගතිමි.. අහ් එහෙමද ? මා ඇයට කීමට දෙයක් නැතුවට කීවෙමි.

සෙමෙන් යන බස් රියෙහි මගීන් දස දෙනෙකුට වඩා නැති තරම්ය. අප දෙදෙනා පමණක් එකම අසුනේ වාඩි වී ගමන් කරයි. නැවත මා කටහඬ අවදි කළෙමි.

ඔයා ඉස්සර වගේම තාම මට ආදරෙයිද? මා එක්වරම ඇසූ ප්‍රශ්නෙන් ඇය ගල් ගැසී ගියත් ඇය එක් වරම එයට පිලිතුරු දුන්නේ නැත.

ඇයි දැන් ඔයා එහෙම අහන්නේ?..

නෑ නිකන්.. ඔයා කියන්නකෝ..

ඇය එයට පිළිතුරක් නොදුන්නාය. ඒ වෙනුවට මගේ අත තදින් අල්ලා ගත්තාය.. ඒ අත ඇයගේ පපුවට ගෙන තද කරන් සිටියාය.. තාමත් ඇයගේ ආදරයේ වෙනසක් වී නොමැත ගතින් අප වෙන් වුවත් දෙදෙනාගේ සිත් තුළ දෙදෙනා තාමත් ජීවත් වෙමින් පවතී.. ඇයගෙ නෙතින් වැටුනු කඳුලු බිඳුවක් මගේ අතට වැටුණි. මා ඇය දෙස බලනා විට ඇය හඬමින් සිටියාය..

ඒයී.. ඇයි අඬන්නේ අඬන් නැතුව ඉන්නවා... කියා මා ඇයගේ කඳුළු පිසුවෙමි..

නෑ නෑ මට ඉස්සර කාලේ මතක් උනා.. මතකද එක දවසක් අපි දෙන්නා මෙහෙම බස් එකෙ යද්දී ඔයා වතුර ටිකක් බොන්න ගිහින් වතුර හලා ගත්තා ඇඟ පුරාම..

ඇය ඒ අතීතාවර්ජනයෙන් මාවද අතීතයට ගෙන ගියාය..

එදා අපි දෙදෙනාම එකම බස් රියෙහි නැග පන්ති යාමට පිටත් උනි..ටික වේලාවක් යන විට මට වතුර තිබහක් ඇති වුනි. මා ඇයගෙන් වතුර

බෝතලය ඉල්ලා වතුර බීමට යන විට බස් රිය ගැසූ බ්‍රේක් පාරට වතුර බෝතලය මගේ ඇඟ පුරාම හැලී යන්නට විය. එයට නොනවත්වා සිනා ඌ ඇය ඇයගේ ලේන්සුව ගෙන මගේ මුහුණ පිස දැම්මාය.

නැවත ඇය ඇගේ නොනවත්වන කතාව පටන් ගත්තාය..

ඔයාට මතකද එක දවසක් ලොකු වැස්සකට අපි අහු වෙලා ඉද්දී පාරේ ගහක තිබ්බ අත්තක් කඩන් වැටුනා.. එදා මන් මාර විදිහට බය උනා..

ඔව් මට මතකයි මහ වැස්සේ යන්න බස් එකක් නැතුව තෙමි තෙමි හිටපු හැටි..

ඇයගේ වල ගැසෙන කම්මුල පෙන්නා ඇය දඟකාර සිනාවක් පෑවාය...

ඇත්තටම මට ඒ දවස් කරපු කියපු දේවල් අනන්තවත් මතක් වෙනවා. එවා දුක්බර මතක උනත් ඒ මතක වලට මන් හරි ආදරෙයි.. මා පැවසුවෙමි.

ඔව් මාත් එහෙමයි... ඒ දවස් හරි ලස්සනයි..

ඔයා දන්නේ නැති උනාට ඔයා ගැන හිත හිත, අපේ පරණ මතක ගැන මතක් කර කර මන් අඬපු වාර අනන්තයි.. ආයේ ඒ දවස් වලට යන්න තිබ්බා නම් කියලා හිතුනු වාර කියා ගන්න බෑ.. මා පැවසුවෙමි.

ඔයා හිතන්නෙ මගේ හිත ගලක් කියලද? මන් රහත් වෙලා කියලද?

නෑ.. නෑ.. මන් කිව්වෙ නිකන්.. ඇය ඔරවා අහක බලා ගත්තාය. කෙසේ හෝ අපි මාතලේටම ඇවිත්ය දෙදෙනාම මුහුනෙන් මුහුන බලා ගත්හ.

ඔයා යන්නද හදන්නේ ? ඇය ඇසුවාය..

මන් මෙතනින් බැහැලා යන්න තමා හිතන් ආවේ. ඒත් දැන් බෑ වගේ දෙන්නම උඩහින් බැහැලා ටිකක් ඇවිදින්න යමුද? මා ඇසුවෙමි..

කොහෙද යන්නේ ඉතින්? ඇය අසුවාය..

කොහේ හරි යන්.. එන්නකෝ.. මා කීවෙමි

හ්ම්.. යන් එහෙනම් ඇය පැවසුවාය..

එයට පසු නැවතුම්පොලෙන් බැස ගත් අපි දෙදෙනා මුළු නගරය පුරාම ඇවිද්දෙහ. නොනැවතීමක් නැති ඇගේ කතාව නිසා කිසි මහන්සියක්ද නොදැනුණි. පැය දෙකක් පමණ ගත කළ අප දෙදෙනා නැවත ගෙදර යාම සඳහා බස් රථයකට ගොඩ උනි.

දෙදෙනාම එකම අසුනේ ඉදගෙන ගමන් කරන්නට විය.. ආව ගමනේදී මෙන් නොව දෙදෙනාම මෙවර නිශ්ශබ්දය.. නැවත වෙන් වී යන බව දෙදෙනාම හොඳින් දනී.. කළ හැකි දෙයක්ද නොමැත.. ඇය මැලවුනු මුහුනෙන් මා දෙස බලා සිටියාය..

මන් හිතන්නේ අය මේ වගේ දවසක් එන්නේ නැති වෙයි.. ගොඩක් වෙලාවට.. අද ඔයත් එක්ක හිටපු පැය කීහිපය මාව අවුරුදු ගානක් පස්සට අරන් ගියා.. මන් කවදාවත් හිතුවේ නෑ මෙහෙම දවසක් එයි කියලා... මා පැවසුවෙමි..

මාත් හිතුවේ නෑ මෙහෙම වෙයි කියලා.. ඇය පැවසුවේ කඳුළු පිරුණ දෙනෙතෙනි...

දැන් මා බසයෙන් බැසීමට ඉතාමත් ලං විය... දෙදෙනාටම වෙන්ව යන බව මතක් වී ඉබේම නෙතට කඳුළු උනන්නට විය..

ඒක වරම මා බදා ගත් ඇය මගේ කම්මුල සිප ගත්තාය.. පෙරළා ඇයව සිප ගත් මා අවසන් වරට ඇයට පැවසුවේ මන් යන්නම්... ඉන්න තැනක පරිස්සමින් ඉන්න..

ඔයත් හැමදාම පරිස්සමට ඉන්න නවීන්.. කවදාවත් ඔයාව මට අමතක වෙන්නෙ නැහැ.. ඇය පැවසුවාය...

බසයෙන් බැස ගත් මා අවසන් වරට මගේ ආදරණීයම පෙම්වන්තියගේ මුහුණ අන්තිමේට දැක්කේ එදායි..

නැවත එවැනි දවසක් උදා වේ යැයි මා සිතන් සිටියත්, එවැනි දවසක් කවදාවත් උදා නොවුණි...

ඉතින් මා මහත් සෙයින් ආදරය කළ මාගේ පෙම්වන්තියගේ අවසන් හමු වීම එයයි...

එලෙස ඒ ආදර කතාවේ අවසානය එසේ දුක්බර අවසානයකින් නිමා විය..



# Online ක්ලාස්

පුතා.. කෝ නැගිටිනවා... දැන් වෙලාව කීයද? කීයටද නැගිටින්න හිතන් ඉන්නේ..

දෙතුන් වරක් ඇසුණු අම්මාගේ කට හඬින් මා අවදි උණි. වෙනදා මෙන් නොව දැන් වේලාසනින් නැගිටීම පවා කරදරයක් වී ඇත. ගෙදරින් එළියට යාමටත් නොහැක. මිතුරෙකුගේ නිවසකටවත් යාමට නොහැක. කාළකණ්ණි ලෙස ජීවිතය ගෙවෙමින් පවතී. මේ සියල්ලට හේතුව මාරාන්තික වසංගතයක් වූ කොරෝනා උවදුරයි. මුළු රටම කොරෝනා විසින් ආක්‍රමණය කර හමාරය..

ආ ලොකු මහත්තයා නැගිට්ටද? ඒ අප්පච්චිගේ කටහඬයි..

මා නෑසුනාක් මෙන් කුස්සිය දෙසට ගියේ උදේ කිරි කෝප්පය බලාපොරොත්තුවෙනි..

අම්මා කෝ මගේ කිරි එක.. මා ඇසුවේ තාමත් නිදිමරගාතයෙනි..

මොන කිරිද? එළියට පහළියකට යා ගන්න විදිහක් නෑ.. සඳුදා වෙනකම් කඬේට යන්න වෙන්නෙත් නෑ... ඕන් කොළකැද හදලා ඇති බොන්න..

කොළකැද..? මා ඇසුවෙමි..

ඔව්. ඇයි වහද ? බොන්න බැරි නම් නිකා ඉන්නවා මට කමක් නෑ..

කොළකැද බොන්නටත් බැරිය. නමුත් බඩගින්නෙ ඉන්නටත් බැරිය.. අවසානයේ කෙසේ හෝ කොළකැද එක බීමට මා තීරණය කලෙමි..

කෝ අම්මා මල්ලී..?

ආන් අර ඉස්සරහට වෙලා හිටියා..

මන් කුස්සියෙන් සාලය දෙසට ගියෙමි. ඔහු රූපවාහිනිය බලන ගමන් ය.

මල්ලි මේ.. මා ඔහුට කතා කළෙමි..

ඕඕඕ.. දවල් වෙලා ක්‍රිකට් ගහමුද?

මොන ක්‍රිකට්ද අයියේ.. මට ගේම් ගහන්න තියනවා..

උඹ ගේම් ගහ ගහ ඉදපන්.. මා ඔහුට බැන වදිමින් කාමරයට ගියෙමි. කිරීමට වැඩකුත් නොමැත.. පාසල්ද වසා දමා ඇත. උපකාරක පන්තිද පවත් වන්නේ නැත. යහළුවන් සමග සෙල්ලම් කිරීමට යාමටද නොහැක..

නැවත කුස්සිය දෙසින් හඩක් ඇසේ.. පුතා.. පුතා..

ඕඕ.. ඇයි අම්මේ?

අද ඔන්ලයින් ක්ලාස් නැද්ද?.. අම්මා ඇසුවාය.

මට එය මතක් උනේ එවිටය.. කොරෝනා සමග පටන් ගත් අළුත් රැල්ල ඔන්ලයින් ක්ලාස් ය.

ආ තියනවා අම්මෙ තව ටික්කින්.. මා පැවසුවත් මේ වන විට පන්තිය ඉවර වීමටත් ආසන්නය..

කොරෝනා එක්ක පටන් ගත්තු ඔන්ලයින් ක්ලාස් දැන් වැසි වසා ඇත. හැම තැනින්ම ඔන්ලයින් පන්ති පවත්වයි..එයද විකාරයක් වී ඇත රෑ දොළහ පමණ වන තෙක් සමහර පන්ති පැවැත්වෙයි. ඒ අස්සෙන් ක්ලාස් වල බහුබූත වැඩද ගොඩකි. දත් මදින ගමන් පවා ක්ලාස් වලට සම්බන්ධ වූ ළමයි ද නැතුවාම නොවේ.. ගෙවල් වල රණ්ඩු වැනි විවිධාකාර දේවල් හැම පන්තියකම පාසා අපිට අසන්නට ලැබේ..

ලහිරු අයියා.. ඉදිරිපස දොර පැත්තෙන් මට කටහඩක් ඇසුණි.

ඒ අපේ ගෙවල් ආසන්නයේ මල්ලි කෙනෙක් වන මිහිර මල්ලියි.. ඔහු මට වඩා අවුරුදු 2ක් පමණ බාල ඉගෙන ගැනීමේ දක්ශ සිසුවෙකි.. නමුත් ඔහුගේ පවුලේ ආදායම කොරෝනා උවදුර හමුවේ බින්දුවටම වැටී ඇත..

ඕ මල්ලි.. කියන්න... මා පැවසුවෙමි.

අයියා මන් මේ පොඩි උදව්වක් ඉල්ලන්න ආවේ.. ඔහු පැවසුවේය..

කියන්න මල්ලි මොකක්ද..? මා ඇසුවෙමි..

අයියා මට ඔන්ලයින් ක්ලාස් කරන්න ෆෝන් එකක් නෑ.. අයියට පොඩ්ඩක් අඩු ගාණකට එකක් හොයලා දෙන්න බැරිද?

ඔහුගේ අසරණ ඉල්ලීමත් ඔහුගේ අසරණකමත් මා ඔහුගේ දෑසින් දුටුවෙමි. හරි මල්ලි මන් ටිකක් හොයලා බලන්නම්.. ඒත් මෙකයි මල්ලි ප්‍රශ්නේ මේ දවස් වල ෆෝන් එහෙම සැහෙන ගානක් වෙනවා.. අලුත්ම එකක් ගන්න නම් බැරි වෙයි.. මා පැවසුවෙමි..

අනේ අළුත් එකක් නොවුනට කමක් නෑ අයියේ.. මට ක්ලාස් ඉන්න තිබ්බා නම් ඇති.. ඔහු පැවසුවේය..

මා හද තුල ඔහු ගැන මහත් අනුකම්පාවක් ඇති විය..

හරි මල්ලි මන් හොයලා දෙන්නම් ඔයාට එකක්.. මා පැවසුවෙමි.

අනේ ලොකු දෙයක් අයියා.. මන් ගෙදරට ගිහින් පස්සේ වෙලාවක එන්නම් කියා ඔහු ගියේය.

ඔහු ගිය පසු ඔහු ගැන මට මහත් දුකක් ඇති විය.. මේ වගේ තව කොච්චර ළමයි ඇත්ද ? මට සිතුනි. මා මෙයට විසඳුමක් කල්පනා කළෙමි..

අම්මේ.. අම්මේ මා අම්මා සොයා කුස්සිය දෙසට ගියෙමි.

මොකද මොකද මේ බෙරිහන් දෙන්නේ?

නෑ නෑ අම්මේ.. අර මිහිර මල්ලි ඉන්නේ..

ඔව් ඉතින්.. අපේ මේ මිහිර ළමය නේ..

ඔව් ඔව් ඒ මල්ලිට ඔන්ලයින් ක්ලාස් ඉන්න ෆෝන් එකක් නැල්ලු... මට අඩුවට ෆෝන් එකක් හොයලා දෙන්න කිව්වා.. මා පැවසුවෙමි.

ඉතින්.. මොකද ඔයා බැලුවද එකක්?

බැලුවා කියන්නේ අම්මේ මන් හොයල් බැලුවා.. ඔක්කොම ගිනි ගණන් මේ දවස් වල..

එතකොට...

මන් බැලුවේ අම්මේ මගේ කැඩිච්ච ෆෝන් එකක් තියනවා.. ඒක හදලා දෙන්න බැලුවේ මේ..

ඒක හොද වැඩක් පුතා එයත් ඉගෙන ගන්න ළමයෙක් නේ..

ඔව් අම්මේ මන් ඒ ෆෝන් එක අප්පච්චිට දෙන්නම් සඳුදට ටවුන් එකට ගිහින් හදන්න එන්න කියන්න..

හරි පුතේ ඔයා මට දෙන්නකෝ.. මන් අප්පච්චිට කියන්නම්.

මට ලොකු සතුටක් දැනුණි.. මන් නිසා තව ළමයෙක්ට ඉගෙන ගන්න අවස්තාවක් ලැබෙන එක ගැන. මන් ෆෝන් එක හදාගෙන ඒම සදහා අම්මට දුන්නෙමි. එදාම හවස අප්පච්චී එය හදාගෙන ගෙනවිත් තිබුණි..

ශා මේ හොදට තියෙන්නේ.. අම්මා කීවාය.

ඔව් අම්මේ දැන් මෙක හෙට දිහාට මිහිර මල්ලිට ගිහින් දෙනවා... මා පැවසුවෙමි.

පසුදා මන් මිහිර මල්ලිගේ ගෙදරට ගියෙමි.

ආ ලහිරු අයියේ.. මොකද මේ පැත්තේ.. ඔහු ඇසුවේය.

මල්ලී මල්ලිට මන් ෆෝන් එකක් හොයා ගත්තා... මන් කිව්වෙමි.

අනේ එහෙමද.. කීයක් වෙනවද අයියා ඒක...

සල්ලි එපා මල්ලී මේක මන් ලග කැඩිලා තිබ්බ එකක්. ඔයා මේක පාවිච්චි කරල ක්ලාස් වලට ඉන්න.. මම පැවසුවෙමි

අනේ අයිය මේ උදව්ව නම් අමතක වෙන් නෑ කවදාවත්.. ඔහු පැවසුවේය.

හරි මල්ලී.. එහෙනම් මන් ගිහින් එන්නම්.

හරි අයියා.. අයියට පින් සිද්ද වෙනවා..

මා ඔහුගේ ගෙදරින් පිට වූ පසු ඔහුගේ මූනේ තිබූ සතුටත්, අහිංසක බලාපොරොත්තුව ඉටු කිරීමට මට හැකි වූ නිසාත් එයින් මා ඉමහත් සතුටක් ලැබුවෙමි.

ෆෝන් එක් දිලා ආවා අම්මේ.. කියා මා ගෙට ගොඩ වුනි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙනප පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරිම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔපනැන්වීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට ෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂන ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී . ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිය යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෙ රවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.15**

